# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1696/14 - 2011 මාර්තු 09 වැනි බදාදා - 2011.03.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.–බී. 6/69.

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි වගන්තියේ (2) වැනි ඡේදය සමග සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ එකී පනතේ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011 මාර්තු මස 07 වැනි දින,
කොළඹ,
ජනාධිපති ලේකම් කාර්යාලයේ දී ය.

නියෝග

1977 නොවැම්බර් මස 15 වැනි දින අංක 291/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබ, 1998 අප්‍රේල් මස 08 වැනි දින අංක 1022/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝග මගින් හා කලින් කළ සංශෝධිත, 2010 නොවැම්බර් මස 22 වැනි දින අංක 1681/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියෝග මගින් අවසන් වරට සංශෝධිත විශේෂ ආනයන බලපත්‍ර නියෝග පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

1. එම නියෝගයේ 2 වැනි නියෝගයේ –

(අ) එහි (i) වැනි ඡේදයේ (ඉ) අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"(ඊ) විවෘත ගිණුම් (O/A)"

(ආ) එහි (viii) වැනි ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

" (viii) ඉහත (i) වැනි ඡේදයේ (ඇ), (ඉ) සහ (ඊ) අනුඡේද යටතේ කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් ඉහත (ii) සිට (vii) දක්වා වූ ඡේදවල විධිවිධාන අදාල නොවිය යුතු ය."


1A - G 14257 — 930 (2011/03)

(ඇ) එහි (xvi) වැනි ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

" (xvi) ආනයනකරුගේ පාර්ශ්වයෙන් 2 වැනි නියෝගයේ (i) සිට (xiv) සහ (xvii) ඡේද සම්බන්ධයෙන් වන යම් උල්ලංඝනයකට අදාලව, අවශ්‍ය අවස්ථාවක දී, ආනයන, අපනයන පාලකවරයාගේ සහයෝගීතාව ඇතිව, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ය." ; සහ

(ඈ) එහි (xvi) වැනි ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :–

"(xvii) (අ) 2 වැනි නියෝගයේ (i) වැනි ඡේදයේ (ඊ) අනුඡේදය ප්‍රකාරව ගෙවීම් කරනු ලැබිය යුතු, ආනයන සම්බන්ධයෙන් වන විට, අදාල නිෂ්කාශන ලේඛන භාරදීමෙන් සහ පහත දක්වා ඇති ආකෘතියෙන් වූ වාණිජ ඉන්වොයිසිය මත වූ ප්‍රකාශයක් මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අදාල භාණ්ඩ මුදාහරිනු ලැබිය හැකි ය.

"මෙම ඉන්වොයිසිය මගින් ආවරණය වන ආනයන සඳහා අප විසින් විවෘත ගිණුම් කොන්දේසි මත ගෙවීම් කළ යුතු බවට මම/අප විසින් මෙයින් සහතික වෙමි/වෙමු. අද දින සිට දින එකසිය අසූවක් (180) ඇතුළත .............. බැංකුව හරහා මෙම ආනයනය සඳහා මම/අප විසින් ගෙවීම් ප්‍රේෂණය කිරීමට සලස්වමි/සලස්වමු.

දිනය ....................................... ............................................................

ආනයනකරුගේ අත්සන.

(ආ) නිෂ්කාශනය කළ අවස්ථාවේ දී "විවෘත ගිණුම් කොන්දේසි මත" භාණ්ඩ මුදා හරින ලද බවට රේගු ප්‍රකාශනයේ සහ වාණිජ ඉන්වොයිසියේ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිටසන් කළ යුතු අතර, භාණ්ඩ නිෂ්කාශනය කිරීමෙන් ඉක්බිතිවම ප්‍රේෂණය කළ යුතු බැංකුව වෙත රේගු ප්‍රකාශනයේ නිශ්චිතව දක්වා ඇති අදාල ආනයනය කිරීම පිළිබඳ විස්තර ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) එම මුදල් ප්‍රේෂණය කරනු ලබන බැංකුව විසින්, ආනයනකරු විසින් ඉදිරිපත් කළ ලේඛණ හා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරන ලද ආනයන පිළිබඳ විස්තර සංසන්දනය කළ යුතු ය. බැංකුව විසින් එම ප්‍රේෂණය පිළිබඳ විස්තර වාර්තා කර ගත යුතු අතර, ප්‍රේෂණය සිදු කර ඇති බවට මුල් රේගු ප්‍රකාශනයේ සහ වාණිජ ඉන්වොයිසියේ පිටසනක් යොදා එකී ප්‍රේෂණයෙන් ඉක්බිතිවම අදාල විස්තර රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතුය.".

2. එම නියෝගයේ III වැනි උපලේඛනය වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් :–

**" III වැනි උපලේඛනය**

මෙම බලපත්‍රය යටතේ ආනයනයන් කිරීමට හිමිකම් ඇති පුද්ගලයෝ සහ පුද්ගල පන්ති –

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු තනි පුද්ගලයකු හෝ තමාගේ ම නමින් හෝ ව්‍යාපාරික නාමයක් යටතේ ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යන තනි පුද්ගලයකු ;

(ආ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරනු ලැබ ඇති ව්‍යාපාරික ආයතනයක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් ආයතනයක් ;

(ඇ) සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත පොදු වෙළෙඳ සමාගම් සහ පුද්ගලික සමාගම් ;

(ඈ) ශ්‍රී ලංකාවේ පදිංචිය සඳහා වලංගු වීසා බලපත්‍රයක් දරන විජාතිකයන්.".

03-769

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.